# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

# බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2021

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීමට තෝරා ගැනීම පිණිස සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2021-07-31 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මක වන බාහිර උපාධි පාඨමාලා**

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
2. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
3. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව.

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය යටතේ ක්‍රියාත්මක වන බාහිර උපාධි පාඨමාලා**

1. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
2. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව
3. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

**අයදුම් කිරීමේ සුදුසුකම් :**

එක් එක් පාඨමාලාවට අදාළ සුදුසුකම් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි සඳහන් වේ.

**ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම**

බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කරනු ලබන්නේ සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් වන බැවින් අයදුම්කරුවන් සංඛ්‍යාව අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්ම වුවහොත් 'Z' ඒකක අගය මත හෝ ප්‍රවේශ පරීක්ෂණයක් මගින් හෝ අදාළ අධ්‍යයනාංශය මගින් තීරණය කරනු ලබන වෙනත් ක්‍රමවේදයක් මගින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය :**

1. පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර මහජන බැංකු ශාඛාවකට මුදල් ගෙවා රිසිට්පතක් ලබාගැනීම අනිවාර්ය වේ.
2. ඔබ විසින් අයදුම් කිරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ, ගංගොඩවිල මහජන බැංකු ශාඛාවේ, පහතින් දක්වා ඇති ගිණුම් අංකයන්ට බැර වන පරිදි දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට පමණක් රු. 1500/= ක මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබාගත් රිසට්පත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවට අදාළ වන පරිදි පහත සඳහන් නිවැරදි ගිණුම් අංකයටම මුදල් ගෙවීම අනිවාර්ය වේ.

| **උපාධි පාඨමාලාව** | **ගිණුම් අංකය** |
|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 072010007119 |
| සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | -072010007069 |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 072010007028 |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 072010007036 |
| විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | - 072010007051 |
| විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | - 072010007127 |

3. external.sjp.ac.lk වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමවේදය (Online) අනුගමනය කරමින් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය. අයදුම්පත ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත (Upload) කළ යුතුය.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ලේඛනයන්හි දෘඪ පිටපත් පහත සඳහන් ලිපිනයට **2021-07-31** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්
   ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්
   iv. බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත.

   (සැ. යු. ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කරන්න.)

**අයදුම්කරුවන් සඳහා උපදෙස්**

❖ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය සම්බන්ධව කටයුතු කරන වෙනත් කිසිදු ආයතනයක් හෝ අනුබද්ධ ආයතනයක් නොමැත. අයදුම්පත් ඉදිරිපත් කිරීම තමන් විසින්ම සිදු කළයුතු වේ. වෙනත් ආයතන මගින් ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වගකියනු නොලැබේ.

❖ ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව වෙනුවෙන් විෂයයන් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු වෙබ් අඩවියෙහි දක්වා ඇති අතර, අයදුම්පත් යොමු කිරීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් වීම ඔබගේ වගකීම වේ.

❖ එක් අයදුම්කරුවකුට එක් උපාධි පාඨමාලාවකට/ උපාධිපාඨමාලා කිහිපයකට අයදුම් කළ හැක. ඔබ හැදෑරීමට අපේක්ෂා කරන උපාධි පාඨමාලාවට අදාළ අයදුම්පත පමණක් මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ සම්පූර්ණ කළ යුතු අතර, එම පාඨමාලවට අයත් ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීමට වගබලා ගත යුතුය. මුදල් ගෙවූ බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ. නියමි ආකෘතිපත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :**

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,**
**තැ. පෙ. අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.**

**ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**
**2021-07-04**